**ශීර්ෂය 277 - මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

**------------------------------------------------------------**

1. **මූල්‍ය ප්‍රකාශන**

**----------------**

1.1 **තත්ත්වාගණනය කළ මතය**

**------------------------------**

මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020 මැයි 29 දින ගණන් දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 මැයි 20 දින ගණන් දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**--------------------------------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

---

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්වය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතු වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරි/ ගණන් දීමේ නිළධාරි දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) උප වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ක්‍රියාත්මක කර ඇතිබව

1.6 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**-----------------------------------------------**

1.6.1 **මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය**

**-------------------------------------**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (i) බිබිල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් පරිගණක යන්ත්‍ර මිලදී ගැනීමට ගෙවා තිබුණු රු.313,500 ක මුදල අංක 277-1-1-0-2102 දරන කාර්යාල උපකරණ වැය විෂයය යටතේ ගිණුම්ගත කළයුතු වුවද, අංක 277-1-1-0-2103 දරන යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ වැය විෂයය යටතේ ගිණුම් ගතකර තිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව වැය විෂයයන් කාණ්ඩගත කර ප්‍රමිතකරණය කරනු ලැබ ඇති ආකාරයට ගිණුම්ගත කළ යුතුය. | පිළිගනිමි. යන්ත්‍ර ස්වභාවයේ උපකරණ මිලදී ගැනීම් 277-1-1-0-2103 වැය විෂයය යටතේද, ගෘහ භාණ්ඩ ස්වභාවයේ උපකරණ මිලදී ගැනීම් 277-1-1-0-2102 වැය විෂයය යටතේද මිලදී ගැනීමට ඇස්තමේන්තු සකස් කළ අතර, ඒ අනුව කටයුතු කරන ලෙස උපදෙස් ලබාදී ඇත. |
| (ii) මැදගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් කාර්යාල උපකරණ මිලදී ගැනීම සඳහා ගෙවා තිබුණු රු. 98,440 ක් කාර්යාල උපකරණ මිලදී ගැනීම 277-1-1-0-2102 වැය විෂයය යටතේ ගිණුම්ගත නොකර, 277-1-2-0-1201 ලිපි ද්‍රව්‍ය හා කාර්යාල අවශ්‍යතා වැය විෂයය යටතේ ගිණුම්ගත කර තිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව වැය විෂයයන් කාණ්ඩගත කර ප්‍රමිතකරණය කරනු ලැබ ඇති ආකාරයට ගිණුම්ගත කළ යුතුය. | ඉදිරියේදී මෙවැනි අඩුපාඩු අවම වන ආකාරයට කටයුතු කරමි. |

### 1.6.2 ගණකාධිකාරීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණකාධිකාරීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචන සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම්ද කරනු ලැබිය යුතුය. එමෙන්ම එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

### 1.6.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නිරීක්ෂණය | | | නිර්දේශය | ගණකාධිකාරීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|---|
| | නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම | | |
| (අ) | 2011 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතින් සංශෝධිත 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ 89 වගන්තිය, 1964 අංක 29 දරන ජල සම්පත් මණ්ඩල පනතේ 16(1) සහ 16(2) වගන්ති සහ 2017 මාර්තු 16 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2010/23 දරන අති විශේෂ ගැසට් පත්‍රය | 13,000,000 | බුත්තල, බඩල්කුඹුර හා මඩුල්ල යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් වගා ළිං ඉදිකිරීමේ ව්‍යාපෘතිය යටතේ වගා ළිං 33 ක් ඉදිකිරීමේදී ඒ සඳහා අනුමැතිය ලබා ගෙන නොතිබුණි. | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී ලබාගතයුතු නීතිමය අනුමැතියන් ලබාගත යුතුය. | අනුමැතිය ලබා ගැනීමට අවශ්‍ය ලිපි යොමු කර ඇත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ආ) | 2018 මාර්තු 19 දිනැති අංක 01/2018 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය හා 2015 ජුලි 10 දිනැති අංක 01/ 2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | - | ස්ථාවර වත්කම් ලේඛනයෙහි ඇතුළත් නොවූ ධාවනය කළ නොහැකි තත්ත්වයේ පවතින, කැබ් රථයක්, ට්‍රැක්ටර් රථයක්, නඟුලක් සහ යතුරු පැදියක් භාවිතයෙන් ඉවත් කර වසර ගණනාවක් ගතවී ඇතත්, මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ඒවා අපහරණය කර නොතිබුණි. | චක්‍රලේඛ උපදෙස් අනුව අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. | රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය මගින් අපහරණය සඳහා අනුමැතිය ලැබී ඇත. |

**2.** **මූල්‍ය සමාලෝචනය**

------------------------

**2.1** **අග්‍රිම කළමනාකරණය**

------------------------

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| ---------------------- | ----------- | ---------------------------------- |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට නොපියවන ලද අග්‍රිම ශේෂය රු. 5,494,393 ක් විය. | වර්ෂය අවසානයට අග්‍රිම ගිණුමේ ශේෂය භාණ්ඩාගාරය වෙත පියවිය යුතුය. | මැතිවරණ කොමිසන් සභාව විසින් මෙම මුදල ප්‍රතිපූර්ණය කළ පසු පියවීමට කටයුතු කරමි. |

## 2.2 වියදම් කළමනාකරණය

--------------------------

වාර්ෂික අයවැය ඇස්තමේන්තු පිළියෙල කිරීම, ප්‍රතිපාදන මාරු කිරීම, ප්‍රතිපාදන උපයෝජනය කිරීම සහ ඉතිරිකිරීම් සම්බන්ධයෙන් නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) අතිකාල හා නිවාඩු දින වැටුප් ගෙවීම සඳහා රු.9,000,000 ක ප්‍රතිපාදන අයවැය ඇස්තමේන්තුව මගින් සලසා තිබුණු අතර, වියදම් දැරීමේදී තවත් රු.2,000,000 ක ප්‍රතිපාදන මුදල් රෙගුලාසි 66 හා 69 අනුව ඒ සඳහා මාරුකරගෙන සමාලෝචිත වර්ෂය තුළ අතිකාල හා නිවාඩු දින වැටුප් ගෙවීම සඳහා රු. 10,983,399 ක් වැයකර තිබුණි. 2019 ජුනි 17 දිනැති අංක 04/2019 දරන අයවැය චක්‍රලේඛයේ 02 (iii) ඡේදය මගින් අතිකාල දීමනා ගෙවීමේදී ආයතන සංග්‍රහයේ හා චක්‍රලේඛවල සඳහන් විධිවිධාන තරයේ පිළිපදින ලෙස දක්වා තිබුණද, එම විධිවිධාන කෙරෙහි අවධානය යොමු නොකර වියදම් දරා ඇති බව නිරීක්ෂණය විය. | චක්‍රලේඛ උපදෙස් අනුව වියදම් දැරීමට කටයුතු කළ යුතුය. | 3/2016 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව මූලික වැටුප් පරිමාණ ඉහල යාම හා වාර්ෂික අයවැය ඇස්තමේන්තුව මගින් ඉල්ලුම් කළ ප්‍රතිපාදන ඒ ආකාරයෙන්ම නොලැබී යාම නිසා ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවූ නිසා භාණ්ඩාගාර අනුමැතිය සහිතව ප්‍රතිපාදන මාරු කළ අතර, වියදම් දැරීමේදී ආයතන සංග්‍රහය සහ චක්‍රලේඛ විධිවිධාන අනුව ගෙවීම් කර ඇත. |

| | | |
|---|---|---|
| (ආ) අයවැය ඇස්තමේන්තුව මගින් ගමන් වියදම් සදහා රු.8,200,000 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර, මුදල් රෙගුලාසි 66 හා 69 අනුව තවත් රු.3,000,000 ක් මෙම වැය විෂයය සදහා මාරු කර ඉන් රු.11,195,358 ක් වැයකර තිබුණි. 2019 ජුනි 17 දිනැති අංක 04/2019 දරන අයවැය චක්‍රලේඛයේ 02(i) ජේදය අනුව ගමන් වියදම් ගෙවීමේදී චක්‍රලේඛ උපදෙස් තරයේ පිළිපදින ලෙස දක්වා තිබුණද, ඒ අනුව කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛ උපදෙස් අනුව වියදම් දැරීමට කටයුතු කළ යුතුය. | 2018 අගෝස්තු 21 දිනැති අංක 20/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව සංයුක්ත දීමනා රේටයන් වැඩිවීම සහ ග්‍රාම නිලධාරීන්ගේ ගමන් වියදම් දීමනා වැඩිවීම හේතුවෙන්, වෙන්කර තිබුණු ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවූ නිසා භාණ්ඩාගාර අනුමැතිය සහිතව ප්‍රතිපාදන මාරු කළ අතර, වියදම් දැරීමේදී ආයතන සංග්‍රහය සහ චක්‍රලේඛ විධිවිධාන අනුව ගෙවීම් කර ඇත. |

## 2.3 තැන්පත් ශේෂයන්

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) වසර දෙකක කාලයක් ඉක්ම වූ රු.10,506,198 ක කොන්ත්‍රාත් රැදවුම් මුදල් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 (3) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | කල් ඉකුත්ව ඇති කොන්ත්‍රාත් රැදවුම් මුදල් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළයුතුය. | පිළිගනිමි. භාණ්ඩාගාරයෙන් ලබාදෙන අක් මුදල් ප්‍රමාණවත් නොවීම නිසා මු.රෙ. 571(3) ප්‍රකාරව කටයුතු කළ නොහැකි විය.ඉදිරියේදී කර්මාන්ත විශ්ලේෂණය කර, ගෙවීම් කිරීමට හා මු.රෙ 571(3) ප්‍රකාරව කටයුතු කිරීමට උපදෙස් ලබාදී ඇත. |

| | | |
|---|---|---|
| (ආ) බිබිල ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගොඩනැගිල්ලෙහි පළමු අදියර ඉටු කිරීමට අදාළව රු.5,614,590 ක් වූ එකතු කල අගය මත බදු, පොදු තැන්පත් ගිණුමට බැර කර තිබුණි.මෙම මුදලින් රු.2,318,000 ක් 2018 දෙසැම්බර් 31 දින විවිධ තැන්පත් ගිණුමට ද, රු.3,296, 590 ක් 2019 දෙසැම්බර් 31 දින ඇප තැන්පත් ගිණුමට ද වශයෙන් තැන්පත් ගිණුම් දෙකකට බැර කර තිබුණි. 2018 දෙසැම්බර් 31 දින තැන්පත් ගිණුමට බැර කල බදු මුදල් ලබා ගැනීම සඳහා වර්ෂයකටත් අධික කාලයක් තුල කොන්ත්‍රාත්කරු එකතු කළ අගය මත බදු නිෂ්කාශන සහතිකය ඉදිරිපත් කර නොතිබුණු අතර, 2019 දෙසැම්බර් 31 දින ද එකතු කල අගය මත බදු මුදල් පොදු තැන්පත් ගිණුමට බැර කර තිබුණි. | නිෂ්කාශන සහතිකය ඉදිරිපත්කල කොන්ත්‍රාත් කරුවන් සඳහා එකතුකළ අගය මත බදු මුදල් ගෙවිය යුතු අතර පසුව ගෙවීම සඳහා බදු මුදල් තැන්පත් ගිණුමට බැර නොකළ යුතුය. | පිළිගනිමි. වලංගු නිෂ්කාශන සහතික ඉදිරිපත් නොකළ බැවින් තැන්පත් ගිණුමට මාරු කර ඇත.තව දුරටත් වලංගු නිෂ්කාශන සහතික ලබා නොදෙන්නේ නම් මෙම ශේෂය රාජ්‍ය ආදායමට බැර කරමි. |
| (ඇ) බුත්තල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2017 වර්ෂයේ ක්‍රියාත්මක කර තිබුණු ව්‍යාපෘති හතරකට අදාලව ඉතිරිව තිබුණු පරිපාලන වියදම් රු. 91,989 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571(3) ප්‍රකාර කටයුතු නොකර එම මුදලින් රු. 83,700 ක් ලැප්ටොප් පරිගණකයක් මිලදී ගැනීම සඳහා වැයකර තිබුණි. | පරිගණක මිලදී ගැනීම සඳහා 277 ශීර්ෂය යටතේ නිශ්චිත වැය විෂයයක් ඇති අතර ඒ සඳහා වෙන්කර ඇති ප්‍රතිපාදන වලින් මෙම වියදම් දැරිය යුතුය. සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ලද පරිපාලන වියදම් වෙනත් කාර්යයන් සඳහා යොදා නොගත යුතුය. | ඉදිරියේදී මුදල් රෙගුලාසි අනුව කටයුතු කිරීමට උපදෙස් ලබා දෙන ලදී. |

## 2.4 අත්තිකාරම් ගිණුම් ශේෂ

---------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ස්ථාන මාරුවී ගිය, මිය ගිය,විශ්‍රාම ගිය, වැඩ තහනම් කළ හා සේවය අතහැරගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු මුළු ණය ශේෂය රු.2,773,724 ක් වූ අතර,එම ණය ශේෂය තුල වසර පහකට වඩා වැඩි කාලයක් ඉකුත්ව ඇති ණය ශේෂය රු.2,283,069 ක් විය. | හිඟ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | නිරවුල් කර ගැනීමට කටයුතු කරමි. |

## 3 මෙහෙයුම් සමාලෝචනය

---------------------------

## 3.1 දේශීය අරමුදල්වලින් ක්‍රියාත්මක කල ව්‍යාපෘති

--------------------------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) ප්‍රදේශීය ලේකම් කාර්යාල 08 ක් විසින් ක්‍රියාත්මක කර තිබුණු ව්‍යාපෘතිවල ඉටුකළ යුතු වැඩ කොටස් අඩුවෙන් ඉටුකර තිබීම, අදාළ නොවන මිල රේටයන් භාවිතා කර තිබීම, මාර්ග මිල ගණන් ලේඛනයේ සඳහන් උපදෙස් අනුව කටයුතු නොකිරීම, නිමකළ වැඩ ප්‍රමාණය ඉක්මවා ගෙවීම් කිරීම හා රජයට වාසිදායක ලෙස ඇස්තමේන්තු සකස් නොකිරීම යනාදී කරුණුවලට අදාළව කොන්ත්‍රාත්කරුවන්ට එකතුව රු.5,267,816 ක් වැඩිපුර ගෙවා තිබුණු අතර | ඇස්තමේන්තු සකස් කිරීම හා ගෙවීම් වාර්තා සකස් කිරීම නිවැරදිව, වගකීමෙන් යුතුව කළ යුතු අතර වැඩිපුර ගෙවූ ඉතිරි මුදල් අයකර ගත යුතුය. | මෙම ව්‍යාපෘතිවලට අදාළව අයකර ගැනීම් පිළිබඳ විස්තර හා පැහැදිලි කිරීම් සිදුකර ඇත. |

| | | | |
|---|---|---|---|
| | 2020 ජුනි 11 දිනට වැඩිපුර ගෙවීම් කර තිබූ මුදලින් රු. 4,228,858 ක් අයකරගෙන තිබුණි. | | |
| (ආ) | මොනරාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින්, ගම්පෙරලිය සංවර්ධන වැඩසටහන යටතේ 2018 හා 2019 වර්ෂ වල අක්කර 07 මාර්ගය සහ මදුරු කැටිය අක්කර 07 ආනපල්ලම මාර්ගය කොන්ක්‍රීට් දමා ප්‍රතිසංස්කරණය කිරීම සඳහා රු.1,932,747 ක් වැයකර තිබුණි. අක්කර 07 මාර්ගය නිමකර වසරක පමණ කාලයකින් පසුවද සහ මදුරු කැටිය අක්කර 07 ආනපල්ලම මාර්ගය නිමකර මාස 07 ක පමණ කාලයකින් පසුවද මෙම මාර්ග දෙකෙහිම තැනින් තැන ගල් මතු වී එම ගල් ගැලවී යමින් පැවතුණි. | නියමිත ප්‍රමිතියට ඉදිකිරීම් සිදු කළ යුතු අතර, ගෙවීම් කිරීමට පෙර අදාළ කාර්යය නියමිත පරිදි ඉටුකර ඇති බව තහවුරු කරගත යුතුය. | මාර්ගවල කොටසක් පිළිසකර කර ඇති අතර, ඉතිරි කොටස පිළිසකර කරන ලෙස කොන්ත්‍රාත්කරු වෙත දැනුම්දී ඇත. |
| (ඇ) | මොනරාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින්, ගම්පෙරලිය 2019 වැඩසටහන යටතේ මාරාව කිවුලේ ආර හරහා බුබුල දක්වා මාර්ගයේ මීටර් 900 ක කොටසක් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා රු. 970,000 ක මුදලකට ගිවිසුමකට එළඹ තිබුණු අතර, මාර්ගයේ සංවර්ධනය කර තිබුණු මීටර් 750 ක් සඳහා රු. 821,166 ක් ගෙවා තිබුණි. එම ඉදිකර තිබුණු මාර්ග කොටසේද තැනින් තැන වලවල් හැරී තිබුණු අතර, ගිවිසුම්ගත දිනට ව්‍යාපෘතිය නිමකර නොතිබුණද, ඊට අදාළ ප්‍රමාද ගාස්තු අයකර නොතිබුණි. එමෙන්ම ගිවිසුම්ගත පරිදි වැඩ කොටස් ඉටු නොකිරීම සම්බන්ධයෙන් කොන්ත්‍රාත්කරුට එරෙහිව ක්‍රියාමාර්ගයක්ද ගෙන නොතිබුණි. | ඇස්තමේන්තුව අනුව වැඩ කොටස් නිමකළ යුතු අතර ව්‍යාපෘතිය නිමකළ පසු ගෙවීම් කළ යුතුය. | ගිවිසුම්ගත මුදලින් සියයට 10 ක මුදල වන රු. 97,100.44 න්, රු.82,116.69 ක් රාජ්‍ය ආදායමට බැර කර ඇත. ඉතිරි මුදල අය කර ගැනීමට කටයුතු කරමි. මාර්ගයේ වලවල් හැරී තිබූ ස්ථානවලින් ඇතැම් කොටස් පිළිසකර කර ඇත. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ගම්පෙරලිය 2019 වැඩසටහන යටතේ මො/ මුතුකෙලියාව මහ විදුහලේ ක්‍රීඩා පිටිය ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා රු. 678,390 ක වියදමක් දරා තිබුණි. මෙම විදුහලේ ක්‍රීඩාපිටියට ආසන්නව කැලෑබද ප්‍රදේශයක නව ක්‍රීඩාපිටිය ඉදිකිරීම සඳහා භූමිය සකස් කර තිබුණු අතර, එම භූමියේ ගල්මතු වී ඇති බවත්, ක්‍රීඩා කිරීම ගැටළු සහගත බවත් දක්නට ලැබුණි. එසේම පාසල සතුව වොලිබෝල් ක්‍රීඩා කිරීම සඳහා සුදුසු ස්ථානයක් පවතින බවත්, වොලිබෝල් ක්‍රීඩා කිරීම සඳහා අළුතින් භූමිය සකස්කර තිබුණු ස්ථානය ක්‍රීඩා කටයුතු සිදු කිරීමට සුදුසු පරිදි සකස් කිරීමට තවත් විශාල පිරිවැයක් දැරීමට සිදුවන බවත්, වැයකර තිබුණු මුදලින් ප්‍රශස්ත ප්‍රතිලාභයක් නොලැබෙන බවත් නිරීක්ෂණය විය. | ව්‍යාපෘති යෝජනා ක්‍රියාත්මක කිරීමට පෙර එයින් ලැබෙන ප්‍රතිලාභ ඇගයීමට ලක් කර ඒ අනුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ යුතුය. | වෙනත් සුදුසු පොදු ඉඩමක් නොමැති බැවින් හා විදුහල් ක්‍රීඩාපිටිය තුල ඉදිකිරීම් සිදු කිරීමට බලධාරීන්ගේ තිබූ අකමැත්ත හේතුවෙන් අදාළ ස්ථානයේ ඉදිකිරීම් සිදු කරන ලද අතර, වෙන්ව තිබූ ප්‍රතිපාදන සීමාව තුළ උපරිම අයුරින් වැඩ නිම කර ඇත. |
| (ඉ) | බිබිල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ග්‍රාමීය ආර්ථික ප්‍රවර්ධන වැඩසටහන 2018 යටතේ වැගම දකුණ මාවතේ ජල ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා 2018 දෙසැම්බර් 31 දින රු. 902,450 ක් වැය කර තිබුණි. මෙම ජල ව්‍යාපෘතිය 2019 ඔක්තෝබර් 16 දින වන විටද, ක්‍රියාකාරී තත්ත්වයේ නොවූ අතර, එය ක්‍රියාකාරී තත්ත්වයට පත් කිරීම සඳහා ජල මෝටරයක් සවි කිරීම හා බෙදා හැරීමේ නල පද්ධතිය සැකසීම යන කාර්යයන් ඉටුකළ යුතුව ඇති බව නිරීක්ෂණය විය. | ව්‍යාපෘතිය ඵලදායි හා ක්‍රියාකාරී තත්ත්වයට පත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. | ව්‍යාපෘතියට වෙන්වූ ප්‍රතිපාදන ප්‍රමාණය අනුව ව්‍යාපෘතිය නිම කර ඇත. ව්‍යාපෘතියේ දෙවන අදියර ලෙස මෝටරයක් සවි කිරීමට ප්‍රතිපාදන ලබාදෙන ලෙස ඉල්ලීමක් කර ඇති බවත්, ඉදිරියේදී ඒ අනුව කටයුතු කිරීමට අපේක්ෂා කරන බවත් දන්වා ඇත. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | මොනරාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ගම්පෙරලිය 2019 වැඩසටහන යටතේ තෙනගල්ලන්ද මංසන්දියේ සිට ඉත්තෑකටුව වැව දක්වා මාර්ගය ග්‍රැවල් යොදා ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ගිවිසුම්ගත වටිනාකම රු.1,940,000 ක් වූ ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු ගොවි සංවිධානයකට පවරා තිබුණි. ගිවිසුම අනුව ව්‍යාපෘතිය 2019 නොවැම්බර් 21 දිනට පෙර නිම කළ යුතු වුවද, පරීක්ෂණ කටයුතු සිදු කළ 2020 ජනවාරි 14 දින වන විටද ඉදි කිරීම් කටයුතු ආරම්භ කර හෝ නොතිබුණි. | ගිවිසුම්ගත පරිදි ඉදිකිරීම් කටයුතු සිදුකල යුතු අතර කොන්ත්‍රාත්තුව පැහැර හැරීම සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. | මෙම කර්මාන්තය අවිච්ඡේද වී ඇති අතර, 2020 වර්ෂයේදී ප්‍රතිපාදන ඉල්ලුම් කර ඇති අතර, අදාළ ප්‍රතිපාදන ලද විගස ඉදිරි කටයුතු සිදු කරමි. |

3.2 **ප්‍රසම්පාදනයන්**

**-----------------**

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

| | **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|
| | **----------------------** | **---------------------** | **-----------------------------** |
| (අ) | 2018 ජූලි 09 දිනැති ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය සඳහා වූ අතිරේක අංක 34 අනුව වෙළඳපොල මිල සැදහුම් ක්‍රමය භාවිතා කර මිලදී ගතහැකි භාණ්ඩ හා සේවාවල උපරිම සීමාව රුපියල් මිලියනයක් වුවද, ඊට අනුකූල නොවී සියඹලාණ්ඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ප්‍රසම්පාදන තීරණ දෙකක් යටතේ එම සීමාව ඉක්මවා රු. 2,382,310 ක වටිනාකමැති භාණ්ඩ මිලදීගෙන තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. | පිළිගනිමි. ඉදිරියේදී මෙවැනි තත්ත්වයන් ඇති නොවීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | තණමල්විල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් විවිධ පාර්ශවයන් වෙත බෙදාදීම සඳහා ඩෙස් 70 ක්, බංකු 77 ක්, ගුරු මේස 06 ක් සහ ගුරු පුටු 10 ක් මිලදී ගැනීම සඳහා රු.1,237,000 ක්ද, අඟල් 1 වතුර මෝටර් 46 ක් මිලදී ගැනීම සඳහා රු.900,000 ක් ද, තණකොළ කපන මැෂින් 52 ක් මිලදී ගැනීම සඳහා රු.600,000 ක් ද වැයකර තිබුණි. 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 (ආ) ඡේදය අනුව රු. 500,000 ඉක්මවන භාණ්ඩ හෝ සේවා සම්බන්ධයෙන් ගිවිසුමකට එළඹිය යුතු වුවද, මෙම මිලදී ගැනීම් සම්බන්ධයෙන් ගිවිසුම්වලට එළඹ නොතිබුණු අතර, ඩෙස්, බංකු, ගුරු මේස හා ගුරු පුටු මිලදී ගැනීම සඳහා සඳහා 2006 රජයේ ප්‍රසම්පාදන පටිපාටිය අනුගමනය කර නොතිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. | පිළිගනිමි. ඉදිරි මිලදී ගැනීම්වලදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කරමි. |
| (ඇ) | ඌන සංවර්ධිත දහම් පාසල් වැඩිදියුණු කිරීමේ වැඩසටහන සහ කන්ද උඩරට උරුමය ආරක්ෂා කිරීමේ වැඩසටහන යන වැඩසටහන් දෙක යටතේ ඩෙස් 117 ක් සහ බංකු 113 ක් මිලදී ගැනීම වෙනුවෙන් වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු. 1,072,300 ක වියදමක් දරා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය. | | |

| | | |
|---|---|---|
| (i) 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1(ආ) ඡේදය අනුව රු.500,000 ක් ඉක්මවන භාණ්ඩ හා සේවා කොන්ත්‍රාත්තුවක් සඳහා විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමක් ලියා අත්සන් කළ යුතු වුවද, මෙම භාණ්ඩ මිලදී ගැනීම සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. | පිළිගනිමි. ඉදිරියේදී ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති වලදී මෙවැනි අඩුපාඩු ඇති නොවීමට කටයුතු කරමි. |
| (ii) ඩෙස් හා බංකු සඳහා මිලගණන් කැඳවීමේ ලේඛනයේ කොන්දේසි අංක 09 හි, ඇණවුම් කළ දින සිට දින 07ක් තුළ ඇණවුම බාර නොදුනහොත් ප්‍රමාදවන සෑම දිනයක් වෙනුවෙන්ම සියයට 0.2 ක දඩ මුදලක් අයකරන බව සඳහන් කර තිබුණු අතර, ඇණවුම නිසි පරිදි බාරදී නොතිබුණද දඩ මුදල් අයකර නොතිබුණි. | මිල ගණන් කැඳවීමේ ලේඛනයේ සඳහන් පරිදි ප්‍රමාද දඩ මුදල් අය කළයුතුය. | ප්‍රමාද දෝෂයකින් එම ඡේදය ගිවිසුමට ඇතුළත් වී ඇති බව ප්‍රාදේශීය ලේකම් විසින් දන්වා ඇත. ඉදිරියේදී අවධානයෙන් සහ සැලකිල්ලෙන් කටයුතු කරන ලෙස නිලධාරින් දැනුවත් කර ඇත. |

**3.3 පාඩු හා හානි**

--------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් කැබ් රථයක් 2002 සැප්තැම්බර් 18 දින අනතුරට පත්ව රු. 375,000 ක අලාභයක් සිදුව තිබුණි. මුදල් රෙගුලාසි 104 (4) වාර්තාව අනුව එම අලාභය රියදුරුගෙන් අයකර ගැනීමට තීරණය කර තිබුණු අතර, 2013 අප්‍රේල් 23 දින පැවති රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාවේදීද | අලාභය අප්‍රමාදව අය කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | රු.75,000 ක් අයකර ඇත. ඉතිරි මුදල් අයකර ගැනීමට උපදෙස් ඉල්ලා ඇත. |

| | | | |
|---|---|---|---|
| | මෙම අලාභය රියදුරුගෙන් අයකර ගැනීමට නියෝග කර තිබුණි. එම නියෝගය ලබා දී වර්ෂ 07 ට ආසන්න කාලයක් ගත වී තිබුණද, එම අලාභයෙන් රු. 75,000 ක් පමණක් අයකරගෙන තිබුණි. | | |
| (ආ) | මොනරාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් කැබ් රථයක් 2009 මාර්තු 23 දින අනතුරට පත්ව තිබුණු අතර, අනතුර හේතුවෙන් වාහනයට සිදුව තිබුණු අලාභයේ වටිනාකම රු.3,175,702 ක් විය. අලාභය පොතෙන් කපාහැරීම සඳහා වන මුදල් රෙගුලාසි 109 වාර්තාව ස්වදේශ කටයුතු අමාත්‍යාංශය වෙත 2015 ජූලි 16 දින යවා තිබුණද, ඒ සඳහා අනුමැතිය ලබාගෙන නොතිබුණි. කැබ් රථය අලුත්වැඩියා කිරීම සඳහා රු. 3,175,702 ක් වැයකර තිබුණද, 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 9.3.1. (ආ) ඡේදය අනුව ඒ සඳහා අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණු අතර, කැබ් රථය රක්ෂණය කර නොතිබීම හේතුවෙන්, අලුත්වැඩියා කිරීම සඳහා දරන ලද සම්පූර්ණ වියදම රජයේ මුදලින් දැරීමට සිදුවී තිබුණි. | අවශය අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතුය. | අමාත්‍යාංශ ලේකම්වරයා අනුමැතිය ලබාදුන් ලිපියක් නොමැති අතර, එම කාල සීමාව තුළ සිටි දිස්ත්‍රික් ලේකම් විසින් අනුමැතිය ලබාදී ඇත. ප්‍රමාණවත් ප්‍රතිපාදන නොමැති බැවින් රක්ෂණය කර නොමැත. |
| (ඇ) | සියඹලාණ්ඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් කැබ් රථයක් 2013 දෙසැම්බර් 23 දින අනතුරකට පත්ව රු.123,574 ක අලාභයක් සිදුව තිබුණි. මෙම අලාභයෙන් සියයට 25 ක මුදලක් එනම්, රු.30,893 ක් රියදුරුගේ විශ්‍රාම පාරිතෝෂිතයෙන් අයකළ යුතු බව 2016 ජනවාරි 27 දිනැති මුදල් රෙගුලාසි 104(4) | අලාභය අප්‍රමාදව අය කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | අලාභය සම්බන්ධයෙන් වගකිව යුතු රියැදුරු මියගොස් ඇති අතර, ඉදිරියේදී අවශ්‍ය කටයුතු සිදු කරමි. |

පරීක්ෂණ වාර්තාවේ දක්වා තිබුණද, එම නිර්දේශ කෙරෙහි සැලකිලිමත් නොවී, අලාභය අය නොකර රියදුරු විශ්‍රාම ගන්වා තිබුණි.

## 3.4 කළමනාකරණ දුර්වලතා

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 ක් විසින් විවිධ වැඩසටහන් යටතේ 2017 සහ 2018 වර්ෂවල මිලදී ගෙන තිබුණු භාණ්ඩ වර්ග 12 කට අයත් ඒකක 311 ක් ප්‍රතිලාභීන් වෙත බෙදා දී නොතිබුණි. | බෙදා නොදුන් භාණ්ඩ ප්‍රතිලාභීන්ට බෙදා දීමට කටයුතු කළ යුතුය. | ඉදිරියේදී බෙදා දීමට කටයුතු කරමි. |
| (ආ) ගබඩා පහසුකම් නොමැති වීම හේතුවෙන් වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් මිලදී ගනු ලබන සහ විවිධ පාර්ශවයන්ගෙන් බෙදාහැරීම සඳහා ලැබෙන භාණ්ඩ ගණකාධිකාරී රජයේ නිවාසය තුළ, කඩා වැටීමට ආසන්න සාද නිවාසය තුළ, කාර්යාල ගොඩනැගිල්ල තුල සහ කාර්යාල පරිශ්‍රය තුල විවෘතව තබා ඇති බව නිරීක්ෂණය විය. | විධිමත් ගබඩා කළමණාකරණ පද්ධතියක් පවත්වාගත යුතුවේ. | ගබඩා පහසුකම් නොමැති වීමෙන් මෙම තත්ත්වය ඇතිවී ඇත. ගබඩාවක් ඉදිකිරීමට ප්‍රතිපාදන ඉල්ලුම් කළද, මේ වන තෙක් ලැබී නැත. |

**4.** **මානව සම්පත් කළමනාකරණය**

**-------------------------------------**

පහත දැක්වෙන කරුණු නිරීක්ෂනය විය.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| (අ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 08 ක සේවක සංඛ්‍යා විස්තරය අනුව මාණ්ඩලික ශ්‍රේණියේ තනතුරු 18ක්ද, ද්විතිය ශ්‍රේණියේ තනතුරු 125ක්ද, ප්‍රාථමික ශ්‍රේණියේ තනතුරු 06 ක්ද පුරප්පාඩුව පැවතුණි. | අත්‍යාවශ්‍ය සඳහා වන පුරප්පාඩු සම්පූර්ණ කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. | පිළිගනිමි. මාසිකව කාර්යමණ්ඩල තොරතුරු පිළිබඳව රාජ්‍ය පරිපාලන , ස්වදේශ කටයුතු හා පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යංශය දැනුවත් කර ඇත. හැකි අයුරින් පුරප්පාඩු අවම කිරීමට කටයුතු කරමි |
| (ආ) 2001 අගෝස්තු 21 දිනැති අංක 18/2001 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව එක් සේවා ස්ථානයක සේවය කළ හැකි උපරිම කාල සීමාව වර්ෂ 05කි. ප්‍රාදේශීය ලේකම් කාර්යාල 08 ක සේවයේ නියුතු නිලධාරීන් 276 දෙනෙකු වසර 06 සිට වසර 28 ක් දක්වා කාල පරාසයක් තුළ එකම සේවා ස්ථානයේ සේවයේ යොදවා තිබුණි. | චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන අනුව ස්ථාන මාරුවීම් සිදු කළ යුතුය. | අදාළ තනතුරු පුරප්පාඩු පිළිබඳව කාර්ය මණ්ඩල තොරතුරු මගින් මාසිකව රාජ්‍ය පරිපාලන , ස්වදේශ කටයුතු හා පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යංශය දැනුවත් කර ඇත. |